**සමූපකාර තොග වෙළඳ සංස්ථාව - 2016**
**-----------------------------------------------**

සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 12 දරන සමූපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනතේ 6 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**------------------------------------------------------------**

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
---------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**
**------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, ලාභ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**2.1 මතය ව්‍යාචනය - සමූහය**
**-------------------------**

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

**මතය ව්‍යාචනය - සංස්ථාව**
**------------------------- --**

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමූහය

### 2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමූහයේ අනෙකුත් සමාගම් වලට අදාලව සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල දක්වන ලද රු.175,229,224 ක් වූ ආදායම්, රු.165,457,431 ක් වූ වියදම් සහ 2016 දෙසැම්බර් 31 දිනට පැවති රු.125,058,856 ක් වූ ජංගම නොවන වත්කම්, රු.75,274,981 ක් වූ ජංගම වත්කම්, රු.61,691,416 ක් වූ හිමිකම්, රු.968,346 ක් වූ ජංගම නොවන වගකීම්, රු.137,674,056 ක් වූ ජංගම වගකීම් සනාථ කරගත හැකි වන ආකාරයේ තොරතුරු හා උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සංස්ථාව

### 2.3.1 සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

සංස්ථාව 2000 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වාම අඛණ්ඩව අලාභ ලැබීම හේතුවෙන් 2013 වර්ෂය අවසානයට රු.7,710,099,424 ක සෘණ අගයක් දක්වා ශුද්ධ වත්කම් හීනවී පැවති අතර 2014 වර්ෂයේ සිදුකළ වත්කම් ප්‍රත්‍යාගණනය හේතුවෙන් ජනිතවූ රු.5,780,204,145 ක් වූ අතිරික්තය හේතුවෙන් ශුද්ධ වත්කම්හි සෘණ අගය 2015 වර්ෂයේදී රු.2,764,039,908 ක් දක්වා අඩුවී තිබුණි. ඉකුත් වර්ෂය දක්වා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල වගකීම් ලෙස දක්වා තිබුණු මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබූ රු. 4,397,000,000ක් වටිනා භාණ්ඩාගාර බැදුම්කර, 2016 නොවැම්බර් 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත සමාලෝචිත වර්ෂයේදී ස්කන්ධ ප්‍රාග්ධනය බවට පරිවර්තනය කිරීම හේතුවෙන් සංස්ථාවේ ශුද්ධ වත්කම් රු. 1,388,648,519 ක ධන අගයක් ගෙන තිබුණි.

### 2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් වසර ගණනාවකට පෙර රාජ්‍ය බැංකුවකින් ලබාගත් කෙටිකාලීන ණය මුදල වෙනුවෙන් 2016 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුළු පොළිය රු.16,427,948 ක් ලෙස හඳුනාගෙන තිබුණද සමාලෝචිත වර්ෂයට අදාල පොළිය හඳුනාගෙන විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැය යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) වෙළඳ ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2006 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය විසින් ලබාදී තිබුණු රු.275,000,000 ක ණයමුදල ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර, එය ආපසු ගෙවිය යුතු ණය ලෙස දැක්වීම වෙනුවට ප්‍රතිව්‍යුහගත කිරීමේ සංචිතයට ඇතුළත් කර තිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ගෙවිය යුතු විගණන ගාස්තු ගණනය කර ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණු රු.8,684,772 ක් වූ "හඳුනානොගත් තැන්පතු" යනුවෙන් බැර ශේෂයක් ඇතුලත් කර එය මුදල් හා මුදල් සමාන දෑ හි වටිනාකම සමඟ හිලව් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල මුදල් හා මුදල් දෑ වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ටින් මාළු මිලදී ගැනීමට අදාල ගනුදෙනු ලෙජර ගිණුම්වල නිසි පරිදි සටහන් නොකිරීම නිසා ණයහිමියන්ට ගෙවිය යුතු රු. 12,628,486 ක් හා ණයගැතියන්ගෙන් ලැබිය යුතු රු. 5,760,978 ක් ලෙජර ගිණුම් වලින් අතහැරී තිබුණි.

### 2.3.4 පැහැදිලි නොකළ වෙනස්කම්

--------------------------------

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන අනුව වී අලෙවි මණ්ඩලයට ගෙවිය යුතු හා මණ්ඩලයෙන් ලැබිය යුතු ලෙස පිළිවෙලින් රු. 274,121,687 ක් හා රු.78,231,544ක් දක්වා තිබුණද වී අලෙවි මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව, සංස්ථාවෙන් ලැබිය යුතු හා සංස්ථාවට ගෙවිය යුතු ලෙස දක්වා තිබුණේ පිළිවෙලින් රු.462,689,308 ක් හා රු. රු.1,202,897 කි. ඒ අනුව පිළිවෙලින් රු.188,567,621 ක හා රු. 77,028,647 ක වෙනසක් විය.

### 2.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පහත සඳහන් ගණුදෙනු සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

(i) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.483,339,255 ක් වූ ජංගම වත්කම් ගිණුම් ශේෂ 13 ක්, එකතුව රු. 251,776,979ක් වූ ජංගම වගකීම් ගිණුම් ශේෂ 2 ක්, එකතුව රු.2,696,357,212 ක් වූ ආදායම් ගිණුම් ශේෂ 6 ක් එකතුව රු. 2,456,454,089 ක් වූ වියදම් ගිණුම් ශේෂ 2 ක් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ, ශේෂ සනාථ කිරීම්, විස්තරාත්මක උපලේඛන, තොග සත්‍යාපන වාර්තා නොමැතිවීම.

(ii) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ ගෙවිය යුතු වටිනාකම් ලෙස ගිණුම් ශේෂ 17 ක එකතු වටිනාකම රු.178,541,559 ක්වූ අතර මෙම ශේෂයන් නිශ්චිතව හඳුනාගැනීමට සහ වයස් විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට නොහැකි වීම.

(iii) කාර්යාල උපකරණ ගිණුමෙහි රු.252,042 ක ශේෂය තහවුරු කිරීම සඳහා ගෙවීම් වවුචර්, ඉන්වොයිස්පත්, භාණ්ඩ ලැබීමේ පත්‍රිකා .

(iv) රු.1,892,760 ක් වූ ස්ථාවර වත්කම්වලට අදාලව ලෙජර් ගිණුම්වල ඇතුලත් කර තිබූ ජ'නල් සටහන්වල නිවැරදිභාවය තහවුරු කිරීමට අදාල තොරතුරු හෝ ගෙවීම් කළ බවට ගෙවීම් වවුචර්.

(v) ටින්මාළු සඳහා අදාල සැපයුම්කරුවන්ට වටිනාකම රු.5,749,080 ක් වූ හිඟ ශේෂ ගෙවීමේදී අදාල වවුචර් පතට ගෙවීම් සහතික කිරීම සිදුකිරීමට අත්‍යාවශ්‍ය වන උපකාරක ලියවිලි.

(vi) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ ගොඩනැගිලි දෙපාර්තමේන්තු තොග ලෙස දක්වා තිබූ රු.4,143,032 ක් වූ පොදු තොගයක් සම්බන්ධයෙන් භෞතික සමීක්ෂණ වාර්තා.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.12,679,243 ක්වූ ණයගැති ශේෂ 48 ක ශේෂ සනාථ කිරීම් කැඳවා තිබුණද රු.8,358,827 ක්වූ ශේෂ 3 ක් සඳහා පමණක් සනාථ කිරීම් ලැබී තිබුණි.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ හා අනෙකුත් ලැබියයුතු වටිනාකම රු.758,355,094 ක් වූ අතර එයින් රු.426,732,845 ක් හෙවත් සියයට 56 ක් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් නොගෙන හානිකරණය සඳහා වෙන්කිරීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) දෙපාර්ශවය අතර ගිවිසුම්වලට එළඹීමකින් තොරව සංස්ථාව විසින් ගොඩනැගිලි 4 ක් 2015 හා 2016 වර්ෂයන්හි බාහිර පාර්ශවයන් වෙත බදු දී තිබුණි. කෙසේ වුවද 2018 මාර්තු 31 දින දක්වා කිසිදු බදු කුලියක් අයකර ගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාලව අයකර නොගත් බදු කුලී ආදායම රු. 5,367,960 ක් විය.

(ඇ) 2016 වර්ෂය තුල ලංකා සතොස සමාගම වෙත ප්‍රවාහන සේවා සැපයීම වෙනුවෙන් අවස්ථා 50 කට අදාලව ප්‍රවාහන ඉන්වොයිස් රු. 136,772,376 ක් නිකුත් කර තිබුණු අතර 2018 ජනවාරි 30 වන විට ලැබී තිබුණු වටිනාකම රු.127,939,218 ක් විය. මේ අනුව 2016 වර්ෂය වෙනුවෙන් තව දුරටත් ලැබිය යුතුව පවතින වටිනාකම රු. 8,833,158 ක් විය.

(ඈ) 2011 වර්ෂයේ දී පාරිභෝගික සේවා අධිකාරිය වෙත කෙටිකාලීන ණය පදනම මත ලබා දෙන ලද රු.1,000,000 ක ණය මුදල හා ඊට අදාල පොලිය ආපසු අයකර ගැනීමට 2018 සැප්තැම්බර් 14 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව 2015 වර්ෂයේදී වෙනත් සංස්ථාවකට ගොඩනැගිලි කුලියට ලබා දී තිබුනු අතර ඒ සඳහා වන මූලික තැන්පත් මුදල හා 2015 හා 2016 වර්ෂයන්ට අදාල බදු කුලී නොලැබීම මත රු.10,984,800 ක මුදල් අයකර ගැනීම අවිනිශ්චිතව පැවතුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1991 අංක 31 දරන සමූපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනතේ 2.2 (අ) වගන්තිය | සංස්ථාවේ මුදල් ආයෝජනය කළ හැක්කේ පවත්නා පොදු සමාගම්වල පමණක් වුවද ඊට පටහැනිව රු.10 ක කොටසක නාමික ආයෝජනයක් සිදුකර “සී/ස සතොස ආර්ථික මධ්‍යස්ථාන සේවා පෞද්ගලික සමාගම” හා “සී/ස සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු පෞද්ගලික සමාගම” නමින් රාජ්‍ය සමාගම් 02 ක් ස්ථාපිත කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 3.17.1 උපවගන්තිය | ප්‍රධාන ණයකරුගේ පාලනය යටතේ කටයුතු කරන කිසිම නිළධාරියෙකු එකී ණයකරුගේ ඇපකරුවෙකු ලෙස පිළිගත නොහැකි වුවත් එම විධිවිධාන උල්ලංඝනය කරමින් නිළධාරිණියක් ලබාගත් රු.50,000 ක ණය මුදල සඳහා ඇය යටතේ සේවය කරනු ලබන නිලධාරීන් දෙදෙනකු ඇපකරුවන් ලෙස යොදා ගෙන තිබුණු අතර සංස්ථාව විසින් එම ඇපකරුවන් පිළිගනිමින් ඇයට ණය මුදල් නිකුත් කර තිබුණි. |
| (ඇ) | 1988 අංක 79 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත | රාජ්‍ය සංස්ථාවල මාණ්ඩලික නිලධරයන් තමන්ගේ වත්කම් සහ බැරකම් පිළිබඳ වාර්ෂික ප්‍රකාශයන් සිදුකල යුතු වුවද නියැදි විගණන පරීක්ෂණයට භාජනය වූ සංස්ථාවේ මාණ්ඩලික නිලධාරීන් 7 ක ගේ ලිපිගොනු වල එම වාර්ෂික ප්‍රකාශ ඉදිරිපත් කල බවට සනාථ කරගත හැකි සාක්ෂි ඇතුලත්ව නොතිබුණි. |

## 2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

අනුමැතියකින් තොරව සංස්ථාව විසින් ණය පදනම මත ඉකුත් වර්ෂ දෙකකදී රු.8,660,782 ක ටින් මාළු පෞද්ගලික ආයතන දෙකකට අලෙවි කර තිබුණි. එයින් රු.2,732,120 ක් 2018 මාර්තු 31 වන විටත් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 504,948,375 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.541,087,014 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.36,138,639 කින් අඩුවී තිබුණි. සංස්ථාවේ අනෙකුත් ආදායම් රු.31,088,977 කින් වැඩිවීම ඉහත ඌනතාවය අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු.674,802,751 ක ඌනතාවය උච්ඡාවචනයන් සහිතව 2016 වර්ෂයේදී රු.504,948,375 ක් වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, බදු හා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.482,495,559 ක සෘණ දායකත්වය උච්ඡාවචනයන් සහිතව 2016 වර්ෂයේදී රු.120,424,702 ක සෘණ අගයක් දක්වා අඩුවී තිබුණි.

## 3.2 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට සංස්ථාවට එරෙහිව රු.89,385,920 ක වන්දි ඉල්ලා නඩු 55 ක් පවරා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල සංස්ථාව විසින් රු.6,524,020 ක වන්දි මුදලක් ගෙවා තිබුණි.

(ආ) සංස්ථාව විසින් ආයතන 08 කට හා පුද්ගලයින් 04 දෙනෙකුට එරෙහිව රු.106,388,058 ක මුදලක් ඉල්ලා නඩු 14 ක් පවරා තිබුණු අතර එමඟින් සමාලෝචිත වර්ෂයේදී රු.24,474,886 ක මුදලක් අයකර ගෙන තිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ දැක්වෙන පරිදි " නවතාවයකින් යුතු භාණ්ඩ උත්පාදනය/ ප්‍රභවය සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම " යන අරමුණ ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්ම තුල දක්වා තිබූ කාර්යයන්හි ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුල අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය අයිතම 15 ක් ආනයනය කිරීමට සැලසුම් කර තිබුණු නමුත් 2016 වර්ෂය තුලදී ආනයනය කළ ආහාර ද්‍රව්‍ය අයිතම ප්‍රමාණය 02 ක් පමණක් විය. තවද සමාලෝචිත වර්ෂය තුල නව ආහාර ද්‍රව්‍ය අයිතම 04 ක් වෙළඳාම සඳහා හඳුනාගෙන ඒ සඳහා බදු සහන ලබාගැනීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල එසේ හඳුනාගෙන බදු සහන ලබාගත් ආහාර ද්‍රව්‍ය අයිතම ප්‍රමාණය 01 ක් පමණක් විය.

(ii) සමාලෝචිත වර්ෂය තුල ගබඩා 04 ක් නැවත ප්‍රතිස්ථාපනය කිරීමට තීරණය කර තිබුණද ප්‍රතිස්ථාපනය කරන ලද ගබඩා සංඛ්‍යාව 02 ක් විය.

(iii) හිඟුරක්ගොඩ සහ පන්නෙගමුව හාල් මෝල්වල වී කෙටීමේ ධාරිතාවය සමාලෝචිත වර්ෂය තුල මෙට්‍රික් ටොන් 24,300 ක් දක්වා වැඩි කිරීමට සැලසුම් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුල වී කෙටීමේ ධාරිතාවයෙහි කිසිදු වැඩිවීමක් සිදුවී නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුල වී මෙට්‍රික් ටොන් 2000 ක් මිලදී ගැනීමට සැලසුම් කර තිබූ නමුත් වර්ෂය තුල මිලදී ගත් වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1270 ක් විය.

(iv) සමාලෝචිත වර්ෂය තුල සංස්ථාවට අයත් රාජගිරිය පරිශ්‍රය මිශ්‍ර ව්‍යාපෘතියක් සඳහා හෝ වෙළඳ මධ්‍යස්ථානයක් බවට පත්කර බදු කුලී ආදායම් ඉපයීමට සැලසුම් කර තිබූ නමුත් එම කටයුතු ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුල ඩී.ආර් විජේවර්ධන මාවතේ පිහිටි ඉඩම ද්විත්ව අරමුණු ව්‍යාපෘති මධ්‍යස්ථානයක් බවට පත්කර බදු කුලී ආදායම් ඉපයීමට සැලසුම් කර තිබුණද එම කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි.

(v) සමාලෝචිත වර්ෂය තුල සංස්ථාවේ ශ්‍රවණාගාරය කුලියට දීම මගින් රු. 1,050,000 ඉපයීමට සැලසුම් කර තිබුණද උපයා තිබූ ආදායම රු. 603,012 ක් පමණක් විය. එම මුදලින් රු. 257,189 ක් 2017 අප්‍රේල් 25 දින වන විටත් ලැබිය යුතුව පැවතුණි.

(vi) සමාලෝචිත වර්ෂය තුල සංස්ථාවට අයත් පැරණි ගොඩනැගිලි නවීකරණය කොට කුලියට දීමෙන් රු. 214,000,000 ක් ඉපයීමට සැලසුම් කර තිබූ නමුත් වර්ෂය තුල කිසිදු පැරණි ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කර නොතිබුණි.

(vii) සමාලෝචිත වර්ෂය තුල සතොස 04 වන මහල කුලියට දීමෙන් රු. 15,000,000 ක් ඉපයීමට සැලසුම් කර තිබූ නමුත් වර්ෂය තුල උපයා තිබුණු මුදල රු. 6,200,000 ක් පමණක් විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් තක්සේරු වටිනාකම රු.54,722,228 ක් වූ වත්කම් සී/ස ලංකා සතොස සමාගමට පවරාදී තිබුණු අතර, ඒ වෙනුවට මුදල් ලබා ගැනීමට හෝ සමාගමේ කොටස් ලබා ගැනීමට හෝ විධිමත් එකඟතාවයකට 2018 මාර්තු 31 දින වන විටත් එළඹ නොතිබුණි.

(ආ) සංස්ථාව විසින් 1999 වර්ෂයේදී පෞද්ගලික සමාගමක රු.9,923,710 ක් ආයෝජනය කර තිබුණද එම සමාගම දිගින් දිගටම පාඩු ලැබීම මත 1999 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කිසිදු ලාභාංශ මුදලක් ලැබී නොතිබුණි.

(ඇ) ඇසුරුම් අංශයේ ආදායමෙන් සියයට 95 කට වඩා වැඩි ප්‍රතිශතයක් ලංකා සතොස සමාගම මත රඳා පැවති නමුත් සේවා සැපයීම හා මුදල් ලබාගැනීම සම්බන්ධව දෙපාර්ශවය අතර ගිවිසුමකට එළඹ නොතිබුණි. එමෙන්ම එසේ එක් ආයතනයක් මත පමණක් සංස්ථාවේ ඇසුරුම් අංශයේ ආදායම රඳවා නොගෙන වෙනත් විකල්ප අවස්ථා ඇතිකර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි.

(ඈ) සංස්ථාව සතු ගොඩනැගිලි හා ගබඩා ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ වටිනාකමකින් යුතු ප්‍රදේශවල ස්ථානගත වී ඇති හෙයින් ඒවායේ නඩත්තු කටයුතු නිසි පරිදි සිදුකර සහ දැනට නිෂ්කාර්යව පවතින ගබඩා හා ගොඩනැගිලි උපරිම ප්‍රයෝජන ලබාගත හැකි ආකාරයට කොටස් කර වෙළඳපොල වටිනාකමට බදු දීමට අවධානය යොමු නොකිරීමෙන් නියැදියක් ලෙස ගබඩා සංකීර්ණ හා ගොඩනැගිලි 08 ක් සැලකූ විට සංස්ථාවට අහිමි වන වාර්ෂික බදු ආදායම රු.245,037,108 ක් විය.

(ඉ) සංස්ථාව විසින් විධිමත් බදුකුලී ගිවිසුමකට එළඹීමකින් තොරව සංස්ථාව සතු දේපල කොටස් 36 ක් මාසික බදුකුලී එකතුව රු. 15,885,376 කට විවිධ ආයතනයන් වෙත බදු පදනම මත ලබාදී තිබුණි.

(ඊ) සංස්ථාව විසින් ගමට සවිය සතොස බඩිය ජංගම අලෙවි රථ ව්‍යාපෘතිය වෙනුවෙන් මූල්‍ය කල්බදු පදනම මත ලබාගත් වටිනාකම රු.105,187,500 ක් වූ ලොරි රථ 99 ක් සමාලෝචිත වර්ෂය තුල නැවත කල්බදු සමාගමට භාරදී තිබුණු අතර එමඟින් සංස්ථාවට සිදුවන මූල්‍යමය ලාභය හෝ අලාභය සම්බන්ධයෙන් කල්බදු සමාගම වෙතින් තහවුරු කිරීමක් ලබාගෙන හෝ සංස්ථාව විසින් ස්වයං අගය කිරීමක් සිදුකර හෝ ඉන් සිදුවිය හැකි බලපෑම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(උ) ටින්මාළු මිලදී ගැනීම සම්බන්ධයෙන් පැවති හිඟ ශේෂ නිරවුල් කිරීමේදී එකම ගැණුම් ඇණවුම් අංකයන් භාවිතාකර සැපයුම්කරුවන් දෙදෙනෙකුට රු. 5,169,972 ක් ගෙවා තිබුණි.

**4.3 ආර්ථික නොවූ ගනුදෙනු**

2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පස් අවුරුදු ව්‍යාපාරික සැලැස්මක් ඇතිව ලොරි රථ 100 ක් යොදා ගනිමින් 2014 දෙසැම්බර් 04 දින ආරම්භ කරන ලද "ගමට සවිය, සතොස බඩිය" ව්‍යාපෘතිය 2015 ජනවාරි මාසයෙන් පසුව අක්‍රීය තත්ත්වයට පත්ව තිබූ අතර 2016 මාර්තු 03 දින වන විට සංස්ථාව එම ව්‍යාපෘතියෙන් ලැබූ අලාභය රු.65,859,217 ක් විය. ව්‍යාපෘතිය අක්‍රීය තත්ත්වයට පත්ව තිබුණද 2018 මාර්තු 31 දින වන විටත් ව්‍යාපෘති සහකරුවකු භාරයේ පවතින ලොරි රථයක් ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය කළමනාකරණ ශ්‍රේණියේ තනතුරු 22 කින්ද, කළමනාකරණ සහකාර මට්ටමේ තනතුරු 51 කින්ද, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 247 ක්ද වශයෙන් මුළු තනතුරු 320 කින් සමන්විත වූ අතර 2018 මාර්තු 31 වන විට අතිරික්ත සේවක සංඛ්‍යාව 242 ක් හා පුරප්පාඩු සංඛ්‍යාව 31 ක් විය.

(ආ) 2012 වර්ෂය තුළ බඳවාගත් නිලධාරියෙකුට 2013 වර්ෂයේදී වැටුප් වර්ධක 3 ක් හා 2014 වර්ෂයේදී වැටුප් වර්ධක 2 ක් බැගින් පිරිනැමීම නිසා සමාලෝචිත වර්ෂය තුල රු.159,390 ක වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. 2012 වර්ෂයේ සිට 2016 මාර්තු 01 වන විට වැඩිපුර ගෙවූ ප්‍රමාණය රු.589,490 ක් වී තිබුණි.

(ඇ) සංස්ථාව ස්ථාපිත පනතේ විධිවිධාන සලසා හෝ වෙනත් නීතියකින් ප්‍රතිපාදන සලසා නොතිබුණු හා සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලයේ ඇතුළත් නොවූ ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරක් සඳහා 2011 වර්ෂයේදී නිළධාරියකු බඳවා ගෙන තිබූ අතර 2011 වර්ෂයේ සිට 2016 මාර්තු 31 දින දක්වා රු.5,781,732 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

**4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලයේ 8.3.9 වගන්තියට පටහැනිව සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී රු. 94,300 ක් වටිනා ස්ථාවර වත්කම් රේඛීය අමාත්‍යාංශය වෙත ලබාදී තිබුණි.

**4.6 වාහන උපයෝජනය**

සංස්ථාවේ ප්‍රවාහන අංශය තුල ධාවනයෙන් ඉවත් කරන ලද යතුරු පැදි 06 ක් හා අළුත්වැඩියා කිරීමකින් තොරව ට්‍රැක්ටර් රථයක් හා ට්‍රැක්ටර් ට්‍රේලරයක් පවතින අතර එම වාහන සම්බන්ධයෙන් 2015 ජුනි 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

තවද කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් තාවකාලික පදනම මත සංස්ථාව වෙත අනුයුක්ත කර ඇති වාහන 03 ක් ආපදාවන්ට ලක්ව දිගු කලක් තිස්සේ සංස්ථාවේ ප්‍රවාහන අංශයේ නවතා දමා ඇති අතර එම වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට පවරා දීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත 2018 ජනවාරි 08 වන දින ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

### 5.2 සංයුක්ත සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සංස්ථාවේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද එය කාලානුරූපීව සමාලෝචනය කර නොතිබුණි.

### 5.3 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණද එහි මානව සම්පත් සංවර්ධන සැලැස්ම, ණය ආපසු ගෙවීමේ සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

### 5.4 අයවැය ලේඛනමය පාලනය

ඇස්තමේන්තුගත ආදායම හා වියදම තථ්‍ය ආදායම හා වියදම සමඟ සැසඳීමේදී සියයට 105 සිට සියයට 1,066 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.5 නොවිසඳී ඇති විගණන ඡේද

නොවිසඳී ඇති විගණන ඡේද පහත දැක්වේ.

| | විගණන වාර්තාවේ යොමුව | ඡේදය |
|---|---|---|
| (අ) | 2011- 4.2 ඡේදය | වටිනාකම රු.5,097,445 ක් වූ "බහළුම් යන්ත්‍ර" 12 හි විදුලි මෝටර් අස්ථාන ගතවීම. |
| (ආ) | 2011- 4.8 ඡේදය | 2006 සැප්තැම්බර් මාසයේදී සංස්ථාව විසින් ආනයනය කරන ලද රු.14,501,998 ක් වූ සහල් සැකසීම් යන්ත්‍ර 140 ක් 2018 මාර්තු 31 වන විටත් සංස්ථාව තුල නිෂ්ක්‍රීයව පැවතීම. |
| (ඇ) | 2012 -2.2.3(ඉ) | 2011 වර්ෂය වෙනුවෙන් වාර්ෂික බදු කුලී හා රටබීම බලපත්‍ර ගාස්තු වශයෙන් ලංකා සතොස සමාගමෙන් ලැබිය යුතු රු.71,561,640 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගැනීමට හෝ ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබීම. |

| | | |
|---|---|---|
| (ඇ) | 2012 - 4.3 (ආ) | කුලී පදනම මත ලබාගත් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් ගබඩා 02 ක ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව රු.78,978,504 ක් වැය කර සංස්ථාව විසින් වී මෝල් ඉදිකර තිබීම. |
| (ඉ) | 2012 - 2.2.3(ඇ) | වාහන විකුණුම් ලාභය රු.5,101,356 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනවල රු.5,892,489 ක් ලෙස දක්වා තිබීම නිසා වාහන විකුණුම් ලාභය රු.791,133 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම. |
| (ඊ) | 2012 - 2.2.4(අ) | 2012 වර්ෂයේ ශේෂ පිරික්සුම පරීක්ෂා කිරීමේදී වත්කම් හා වියදම් ගිණුම් 168 ක එකතුව රු.27,584,061,602 ක් වූ හර ශේෂයන්ද වගකීම් හා ආදායම් ගිණුම් 110 ක එකතුව රු.30,129,471,178 ක් වූ බැර ශේෂයන් ද මූල්‍ය ප්‍රකාශන සමග එකඟ නොවීම. |
| (උ) | 2012 - 2.2.5(අ) | 2012 දෙසැම්බර් 31 දින දක්වා ඇසුරුම් අංශය වෙත ලැබී තිබුණු මුළු සුදු සීනි ප්‍රමාණය සම්බන්ධයෙන් කි.ග්‍රෑ. 15,000 ක ප්‍රමාණයකට අදාලව රු.18,450 ක ගාස්තුවක වෙනසක් සහ පැකට් 23,514 ක් හෝ කි.ග්‍රෑ.170,119 ක් වූ ඇසුරුම් ද්‍රව්‍ය අඩුමානයට අදාල ආදායම් අහිමිවීමේ අවදානම පිළිබඳව කළමනාකාරිත්වය 2018 මාර්තු 31 දින දක්වා කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම. |
| (ඌ) | 2013 - 2.2.3 (අ)iii | ශේෂ පිරික්සුම හා මූල්‍ය ප්‍රකාශන සැසඳීමේදී ගිණුම් ශේෂ 03 ක රු.299,798,933 ක් වූ වෙනසක් අනාවරණය වීම. |

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර සංස්ථාවේ සභාපතිවරයා දැනුවත් කරන ලදී.පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ලෙජර ගිණුම් සඳහා කේත අංක භාවිතා නොකිරීම. |
| | (ii) ජ'නල් වවුචර සඳහා සංලක්ෂයන් නිවැරදිව භාවිතා නොකිරීම. |
| | (iii) වවුචරයට අදාල උපකාරක ලියවිලි නිසි පරිදි වවුචර සමඟ අමුණා නොතිබීම. |

| | | |
|---|---|---|
| (ආ) බදුකුලී ආදායම් අයකර ගැනීම | (i) | හිඟහිටි බදුකුලී අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර නොගැනීම. |
| | (ii) | බදුකුලී ගිවිසුම්වලට නොඑළඹීම හා බදු ගිවිසුම් වලට අනුව කටයුතු නොකිරීම. |
| (ඇ) මිලදී ගැනීම් පාලනය | (i) | තොග කුට්ටාන්සි වල වගකිවයුතු නිළධාරියකු අත්සන් තබා නොතිබීම. |
| | (ii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතැම් මාර්ගෝපදේශ අනුව කටයුතු නොකිරීම. |
| (ඈ) ලේඛන නඩත්තු කිරීම | | ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර නොතිබීම. |
| (ඉ) පෞද්ගලික ලිපිගොනු | (i) | පත්වීම් ලිපිය තමා වෙත ලැබුණු බවත් එම ලිපියෙහි දැක්වෙන නියමයන් හා කොන්දේසි යටතේ තමා තනතුර භාරගන්නා බවත් සඳහන් ලිපියක් අදාල පත්වීම් භාරගන්නා නිලධාරියාගෙන් ලබා නොගැනීම. |
| | (ii) | නව පත්වීමක් ලබාගන්නා නිලධාරියෙකු වෛද්‍ය පරීක්ෂණයට ඉදිරිපත් කර වෛද්‍ය වාර්තාව ලබාගෙන පෞද්ගලික ලිපිගොනු වල ඇතුලත් කළ යුතු වුවත් එලෙස කටයුතු නොකිරීම. |
| | (iii) | පත්වීම් ලබාගන්නා නිලධාරියෙකු එවැනි තනතුරකට පත්වී මාසයක් ඇතුලත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 07 වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘති පත්‍රය ප්‍රකාරව ප්‍රතිඥා හෝ දිවුරුම ලබා නොගැනීම. |
| | (iv) | චර්යා සටහන් පවත්වා නොගැනීම. |